# ලොයොලා විද්‍යාලය බෝපිටිය

11 ශ්‍රේණිය

ප්‍රතිඵල සංවර්ධන ක්‍රියාවලිය

# සමීප අර්ථය



LIVEWORKSHEETS

## 11 ශ්‍රේණිය

## සමීප අර්ථය

■ එක් එක් වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත කොටසේ අර්ථයට වඩාත් සමීප අර්ථය දෙන වචනය තෝරන්න.

01. සුනිමල් තමාට ලැබුණු ධනස්කන්ධය **අත දිග හැර** වියදම් කළේය.
1) ලෝභ කමින් යුතුව   2) ලෝභ කමක් නැතිව
3) අනවශ්‍ය ලෙසින්   4) අතේ දුරින් සිටින අයට

02. '**කරබාගෙන** ඔය වැඩ ටික ඉක්මනට ඉවරයක් කරන්න' යි ප්‍රධානියා සේවකයින්ට උපදෙස් දුන්නේය.
1) නිශ්ශබ්දව   2) බෙල්ල නවාගෙන
3) උරහිස අකුලාගෙන   4) බෙල්ල ඔසවාගෙන

03. ආයතනයට අලුතින් පත්ව ආ නිලධාරීහු බලධාරීන් තමන්ට **කුඩම්මාගේ සැලකිලි** දක්වන බව සුබ සාධක නිලධාරියාට දැන්වූහ.
1) හොඳ පිළිගැනීමක්   2) සුළු සහයෝගයක්
3) වෙනස්කමක්   4) අයථා බලපෑමක්

04. ශීල ව්‍යාපාරයේ යෙදුණු රැඳවියෝ කිසි **හැලහොල්මනක්** නැතිව භාවනාවේ යෙදුණහ.
1) කලබලයකින් තොරව   2) බොහෝ නිශ්ශබ්දව
3) කතාබහක් නොමැතිව   4) ඉතා සාමකාමී ලෙස

05. ඇතැම් දූෂිත මිනිසුන්ගේ **උල්පන්දම් දීම** නිසා මත් උවදුර සමාජ පිළිලයක් බවට පත්වී ඇති බව පෙනේ.
1) උපකාර කිරීම   2) රහසින් අනුබල දීම   3) උපදේශ දීම   4) දිරි ගැන්වීම

06. ඕවා '**කෝපි කාලේ** වැඩ'යි, කියමින් තරුණ පුතු සිය පියාගේ යෝජනාව එක්වරම ප්‍රතික්ෂේප කළේය.
1) ඉංග්‍රිසි යුගයේ   2) රාත්‍රී කාලයේ   3) අසීරු අවධියේ   4) පුරාණ කාලයේ

07. සේවකයින්ගේ **බඩට ගැසීමට** කිසිවිටක සූදානම් නොවන බව කාර්යාලයේ ප්‍රධානියා පැවසුවේය.
1) දඬුවම් දීමට   2) රැකියාව අහිමි කිරීමට
3) බඩට පහර දීමට   4) වැටුප් නොගෙවීමට

08. නිවසට පැමිණි සේවිකාව **ආවාට ගියාට** වැඩ නොකරන බව අම්මා කීවාය.
1) නොසැලකිල්ලෙන්   2) සැලකිල්ලෙන්   3) යන එන ගමන්   4) උදාසීන ලෙස

09. **දිවෙන් දිව ගාගෙන** සිටි මිතුරා හදිසියේ විදේශගත වීම නිසා සිරිමල්ට දැඩි සිත් වේදනාවක් ඇති විය.
1) දැඩි සතුරුකමින්   2) එක පන්තියේ වාඩිවී
3) ප්‍රිය වචන කතා කරමින්   4) දැඩි හිතවත්කමින්

10. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා බාල දරුවන් **දඩමීමා කර ගැනීම** කිසිවිට නොකළ යුත්තකි.
1) වාසියට යොදා ගැනීම   2) යහළු කර ගැනීම
3) කුළුමීමා කර ගැනීම   4) විලාසිතා බවට පත් කිරීම

11. දේශපාලන පෙරළියක් සමඟ බොහෝ දෙනෙකුගේ **අං ඇවිල්ලා** යැයි නායකතුමා පැවසීය.
1) දැනුම වැඩි වී   2) පොහොසත් වී   3) ආඩම්බර වී   4) හිත් අමනාප වී



LIVEWORKSHEETS

12. බමරය වැල්ලේ කැරකෙන කාලය කෙදිනක හෝ තමන්ට උදාවන බව සිතූ හෙතෙම මහන්සි වී තම වැඩ කටයුතු කළේය.
1) විපතක් සිදුවන කාලය 2) වාසනාවන්ත කාලය
3) මුදල් ලැබෙන කාලය 4) ග්‍රහ මාරුවක් සිදුවන කාලය

13. **ඉවක් බවක් නැතිව** කරන වියදම් නිසා බොහෝ ආයතන පරිහානියට පත්වේ.
1) තිබෙන තරමට 2) තියෙනවාටත් වඩා 3) ඕනෑවට වඩා 4) ආවාට ගියාට

14. පොලියට මුදල් ලබාදෙන ගුණසිරි මාමා **හරි හතර වරං කාරයෙක්** යැයි මුදලාලි පැවසුවේය.
1) මහ වංචනික පුද්ගලයෙක් 2) විශ්වාස කළ හැකි අයෙක්
3) අනුන්ට උදව් කරන්නෙක් 4) හතර පැත්තෙම යන කෙනෙක්

15. චූටි මල්ලී ළිඳ ළඟටම දුවනු දුටු අම්මා මගේ "**ඇගේ ලේ වතුර වුණා**" යැයි කීවාය.
1) ඇගේ ලේ ටික ඔක්කෝම වතුර වුණා 2) හොඳටම බය වුණා
3) ඇඟට ලේ ඉණුවා 4) ඉවසීමක් නැති වුණා

16. පුරාණ කාලයේ සියලු සිරිත් විරිත් **කෝපි කාලයේ වැඩ** යැයි අතහැරීම සුදුසු නොවේ.
1) වැඩකට නැති වැඩ 2) යල් පැන ගිය වැඩ
3) කෝපි බොන විට කරන වැඩ 4) කෝපි වැවූ යුගයේ වැඩ

17. ඇතැම් ආයතන ප්‍රධානීහු තම සේවකයන්ට **සුදු එැණු පොඩිකරමින්** සේවා අයිතීන් නොදී පීඩාවට පත් කරති.
1) බොරුවෙන් මුළා කරමින් 2) ඇත්ත බොරු කරමින්
3) ආයතන වසා දමමින් 4) සේවකයන් කුපිත කරමින්

18. ඔහු අප සමග අමනාප වී **පැදුරටත් නොකියා ම** යන්නට ගියේය.
1) ඉතා නිහඬව 2) පැදුර දෙස නොබලාම
3) කිසිවෙකුටත් නොකියාම 4) හිමිදිරි පාන්දර ම

19. තම දියණියගේ සරණ මංගල්‍යය ඉතා ඉහළින් පවත්වන බව පැවසූ ගුණපාලගෙන් කපු මහතා දෑවැද්ද ගැන විමසා සිටි කල, **ඇසල පෙරහරට බෙරත් හිඟදැයි** ගුණපාල පවසා සිටියේය.
1) සරණ මංගල්‍යයට බෙර ඇති බව 2) සියල්ල සම්පූර්ණ බව
3) පෙරහැරේ බෙර හිඟ වූ බව 4) ඇසළ මාසයට බෙර ගසන්නේ නැති බව

20. ඔහු කුමන පක්ෂයක් තෝරා ගන්නවාදැයි සිතමින් **එළිපත්ත උඩ ඉන්නවා** යැයි පාක්ෂිකයෝ කීහ.
1) උළුවස්ස උඩ ඉන්නවා
2) කුමන පක්ෂයකට යා දැයි තීරණය කරගත නොහැකිව ඉන්නවා
3) දැඩි බලාපොරොත්තුවෙන් ඉන්නවා
4) දැඩි දුකින් ඉන්නවා

21. දරුවා **ඇඟිලි ගනිමින්** සිටියේ විදේශගතව සිටි තම පියා පැමිණෙන තෙක්ය.
1) ඇඟිල්ලෙන් ඇඟිල්ල ගැන ගැන 2) දෑඟිලිවලින් ඉස්සෙමින්
2) දැඩි බලාපොරොත්තුවෙන් ඉන්නවා 4) දැඩි දුකින් ඉන්නවා

22. වේගයෙන් මා දෙසට ආ බස්රියේ නොහැපී බේරුණේ **අනූනවයෙනි.**
1) අනූනවවෙනි කණුව අසල 2) අවුරුදු අනූනවයක් වයස
3) බේරීම ඉතා පහසු විය 4) යාන්තමින් බේරුණා

23. පැන ගිය සොර මුළ සොයා පොලීසිය නගරය **දෙවනත් කළේය.**
1) ඔත්තු බැලීම 2) ආරක්ෂාව තර කළේය
3) මැනවින් සොයා බැලීය 4) තර්ජනය කළේය



LIVEWORKSHEETS

24. වාරි තාක්ෂණයේ **හර පද්ධතියක්** ලෙස 'සැමට ජලය' ලබාදීමේ ක්‍රම ශිල්පය නම් කළ හැකිය.
1) වටිනාකම් සමූහයක් 2) වාරිමාර්ග පද්ධතියක්
3) ජලහරණයක් 4) ජල මාර්ග ජාලයක්

25. පොල් වගාවේ සාර්ථකත්වයට **පාරිසරික සාධක** අත්‍යවශ්‍ය වේ.
1) පරිහරණය වන 2) පරිසරයට අයත්
3) පරිභෝජනය කරන 4) පාරිභෝගිකයන්ට මුදිත

26. තමා **මුරුංගා අත්තේ තැබීම** ගැන ආයතන ප්‍රධානියා අප්‍රසාදය පළ කළේය.
1) අනවශ්‍ය ලෙස වර්ණනා කිරීම 2) උසස් තනතුරකට පත් කිරීම
3) අවදානම් තැනක තැබීම 4) නොමනා කටයුත්තකට යොමු කිරීම

27. අන් අයගේ වැඩ කටයුතුවලට **අකුල් හෙළීම** ඇතැමෙකුගේ සිරිතකි.
1) කැලෑ එළිකිරීම 2) එකට එක කිරීම 3) බාධා කිරීම 4) අනුබල දීම

28. **තොරතෝංචියක්** නැතිව ඇසෙන කුරුලු නාදය පරිසරයේ නිහඬතාව බිඳ දැමීමේය.
1) වෙන්කොට හඳුනා ගත නොහැකි සේ 2) තේරීමකින් තොරව
3) කෝලාහලයක් සේ 4) දිගින් දිගටම පැවතෙන

29. ඔහු මේ දිනවල **වැලේ වැල් නැතිව** කල්පනා කරමින් සිටියි.
1) බලවත් ලෙස රෝගාතුර වී 2) යාචකයකු බවට පත්වී
3) දැඩි ආර්ථික අපහසුතාවට පත් වී 4) ගැටලු සහගත තත්ත්වයට පත්වී

30. **අනුන්ගේ පහනෙන් එළිය බැලීම** යහපත් නොවන බව ගුරුතුමිය ඇයට කීවාය.
1) අනුමානයෙන් කටයුතු කිරීම 2) අනුන්ගේ උපකාරයෙන් කටයුතු කිරීම
3) අනුන්ගේ පහන් දල්වා එළිය බැලීම 4) අනුන් වෙනුවෙන් පහන් දැල්වීම

31. **තොරතෝංචියක් නැතිව** පැමිණි කරදර සුගුණවතී වෙහෙසට පත් කළේය.
1) වරින් වර 2) දිගින් දිගටම 3) අවසරයකින් තොරව 4) විටින් විට

32. ඔහු **හය හතර දැනගන්නට පෙර** පියා අහිමි විය.
1) ගණින් ඉගෙන ගන්නට පෙර 2) ඉගෙන ගන්නට වුවමනා කාලයේ
3) ගතිපැවතුම් හොඳවීමට පෙර 4) හොඳ නරක වටහා ගන්නටත් පෙර

33. අපි ලෝක කුසලාන දිනූ ශ්‍රී ලාංකික ක්‍රීඩකයා මහත් **හරසරින්** පිළිගත්තෙමු.
1) ඉතා ආදරයෙන් 2) ඉතා ඉහළින් 3) ඉතා කැමැත්තෙන් 4) මානව දයාවෙන්

34. මාධ්‍ය වැටලීම් නිසා දූව ජාවාරම්කරුවන්ගේ රහස් සියල්ලම **එළිදරව්** විය.
1) අනාවරණය 2) ආවරණය 3) නිරාවරණය 4) ප්‍රචාරණය

35. කුණු කන්ද පුපුරා යාමෙන් මිනිස් සමාජය මහත් **ආන්දෝලනයට** පත් විය.
1) පුදුමයට 2) ශෝකයට 3) කැලඹීමට 4) කරදරයට

36. දුටු දෙයින් පුදුමයට පත් වූ මම **තක්බිරිව** සිටගෙන සිටියෙමි.
1) කනස්සල්ලෙන් යුතුව 2) සතුටින් 3) පුදුමයෙන් 4) බියෙන් ගල් ගැසී

37. වංචනිකයන්ගේ ක්‍රියාකලාපය එළිදරව් වීමත් සමගම එහි පරීක්ෂණ වාර්තා ගැන සියලු දෙනා **ඇහැ ගහගෙන** බලා සිටිති.
1) දෑස් අයාගෙන 2) කම්පා වෙමින්
3) දැඩි සෝදිසියෙන් යුතුව 4) ප්‍රචණ්ඩකාරී ලෙස



LIVEWORKSHEETS

38. ගංවතුර තර්ජනයට මුහුණ දුන් ප්‍රදේශවාසීන් විශාල පිරිසකට **උන්හිටි තැන් අහිමි** විය.
1) දේපළ  2) වාසස්ථාන  3) නවාතැන්  4) වස්තුව

39. බිරිඳගේ **කනිපින්දම්** අසා සිටි සියදෝරිස් ගමෙන් යාමට ගත් තීරණය වෙනස් කළේය.
1) තමාගේ දක කියා පෑම  2) බැණ වැදීම  3) අගය කිරීම  4) ගමේ දොස් දැකීම

40. **තකහනියේ** ගමට පැමිණෙන අය පිළිබඳවත්, පිටවන අය පිළිබඳවත් විමසිල්ලෙන් සිටිය යුතුය.
1) ප්‍රමාද වී  2) හදිස්සියෙන්  3) තනියෙම  4) නිශ්ශබ්ද

41. "**ඒ ඇයි හොඳයිය** නම් ඒ තරම් දුර දිග යන එකක් නොවේ" යැයි පියා විශ්වාසයෙන් යුතුව පැවසුවේය.
1) අහංකාරය  2) හිතවත්කම  3) කරදරය  4) කැමැත්ත

42. "**සීරු මාරුවට** වැඩක් කරලා පුරුද්දක් නැති හැටි" යි අත්තම්මා නංගිට දොස් නැඟුවාය.
1) නිවැරදිව  2) පරිස්සමට  3) මග හරිමින්  4) ඉතා හොඳින්

43. සේවකයා තම ආයතනයේ සුබ සාධක සංගමයෙන් **අතමාරුවක්** ගැනීමට කල්පනා කළේය.
1) අත්වාරුවක්  2) උදව්වක්  3) අත්පිට මුදලක්  4) ණය මුදලක්

44. අබරං සීයා "**දූන් ඉතිං අලි මදිවට හරක්**" යි කියමින් පිළිට ගොඩ විය.
1) බාධාවක් සිදු වීම  2) කරදරයක් පිට තවත් කරදරයක් සිදු වීම.
3) අලින්ගෙන් හා හරකුන්ගෙන් කරදර වීම  4) අවාසි සහගත දෙයක් සිදු වීම.

45. "**හිතේ කහටක්** තියාගෙන නම් අපේ ගෙදර එන්න එපා" යි අත්තම්මා චෝදනා මුඛයෙන් පැවසුවාය.
1) කරදරයක්  2) චෝදනාවක්  3) අමනාපයක්  4) පසුතැවිල්ලක්

46. "හිටවපු පැළ ටික සේරම **හේ බාලා**"යි උක්කුරාල අහස දෙස බලමින් මුමුණන්නට විය.
1) විනාශ වෙලා  2) මැලවීලා  3) පාළු වෙලා  4) කේඩෑරි වෙලා

47. අනතුර ගැන ඇසූ විට තමාට **ගිනි පත්තු** වූ බව මුරකරු කීය.
1) බියට පත් වූ  2) කරදරයට පත් වූ  3) අසහනයට පත් වූ  4) ලැජ්ජාවට පත් වූ

48. විශාල භූමි ප්‍රදේශයක් වසා පැතිරුණු කුණු කන්ද කඩා වැටීමෙන් බොහෝ පිරිසකට **උන්හිටි තැන්** අහිමි විය.
1) දේපළ  2) වාසස්ථාන  3) නැවතී සිටි තැන්  4) වස්තුව

49. ආගන්තුකයාගේ **අලගිය තැන් මුල ගිය තැන්** දැන ගැනීමට නිවැසියා උත්සුක විය.
1) අනවශ්‍ය විස්තර  2) දීර්ඝ විස්තර  3) සියලු විස්තර  4) ලුහුඬු විස්තර

50. ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයන්ගේ **කඹ ඇදීම** හේතුවෙන් සිංහල අවුරුද චාරිත්‍ර පිළිබඳව ඇතැමුන්ගෙන් විවේචන එල්ල විය.
1) එකඟ බවක් නැති වීම  2) හැම දෙනා එකඟ වීම
3) තරඟයක් පැවතීම  4) දෙපක්ෂයම ජය ගැනීම

51. වැඩ වර්ජනයට සහභාගී වූවන් **එක එල්ලේ** චෝදනා කළේ පාලන පක්ෂයටයි.
1) එල්ලය බලා  2) ඍජුවම  3) ඉලක්කයට  4) නිවැරදිවම

52. නගරයේ රැකියාවට යාමෙන් පසු සිරියාවති **අළු ගසා දමා ඇති** බව ගම්මු පවසති.
1) දර ලිපේ ඉවීම නවතා  2) ගම අමතක කර
3) බොහෝ සෙයින් හැඩ වී  4) දිළිඳු නෑයන් ඈත් කර



LIVEWORKSHEETS

53. වගඋත්තරකරුවන් ඉදිරිපත් කළ සියලු ලේඛන කූඨ නිලධාරින් විසින් **අකාමකා දමන** ලද බව පැතිරෙන්නට විය.
1) ඉවත දමන　2) අනිසි ලෙස යොදන　3) විනාශ කරන　4) යොදා ගන්නා

54. **මූණ බලා** තනතුරු දීමෙන් පරිපාලන කටයුතු අවුල් වන බව විද්වත්හු පවසති.
1) අල්ලස් ගෙන　2) හිතවත්කම් අනුව　3) තත්ත්වය සලකා　4) රහසිගතව

55. පාසල් සංවර්ධන සමිතියේ භාණ්ඩාගාරික තනතුර සඳහා කීපදෙනෙකු **පොර බඳන** බව සාමාජිකයෝ පැවසූහ.
1) තරග' කරන බව　2) ඔට්ටු අල්ලන බව　3) රණ්ඩු කරන බව　4) විවාද කරන බව

56. තම නිවසේ අයිතිය ලොකු අයියාට පැවරීම ගැන **හිතේ කහටක්** ඇතිකර නොගන්න යැයි තාත්තා ඉල්ලා සිටියේය.
1) වෛරයක්　2) කුතුහලයක්　3) අමනාපයක්　4) සැකයක්

57. අපත් **ඉරහඳ දුටු මිනිසුන** යයි කණ්ඩායම් නායකයා සභාවට කියා සිටියේය.
1) නූගත් ජනතාව　2) ශාන්තිකර්ම කරන මිනිසුන්
3) යමක්කමක් දන්නා මිනිසුන්　4) විද්‍යාඥයින්

58. විභාගය අසමත් වුණු තම දරුවා දෙස මව **අන්දමන්දව** බලා සිටියාය.
1) කැළඹීමට පත්ව　2) හැඬූ කඳුළෙන්　3) විමසිල්ලෙන්　4) අධික සතුටෙන්

59. **අඳුනන බල්ලන්ගේ බිරීම්** ගණන් නොගත යුතු බව පැහැදිලි කළෝ පුරාණ පඬිවරුය.
1) හිතවත්කම්　2) සෝෂා කිරීම්　3) වෛර කිරීම්　4) බොරු තර්ජන කිරීම්

60. **ඉවක් බවක් නැතිව** කැළෑ එළි කිරීම අනාගත මහා විනාශයකට අත වැනීමකි.
1) සම්පූර්ණයෙන්ම　2) අපරීක්ෂාකාරීව　3) නොසැලකිල්ලෙන්　4) අධික වේගයකින්

61. අසාධාරණයෙන් ලබාගන්නා දෙයින් කිසිම **වගතුවක්** නොවන බව උන්වහන්සේ වදාළ සේක.
1) වගකීමක්　2) නිරෝගීභාවයක්　3) ප්‍රතිඵලයක්　4) යහපතක්

62. **හිතවතුන්ට ආඩපාළි කීම** දැන්වත් නැවැත්විය යුතුබව පක්ෂ නායකයෝ තීරණය කළහ.
1) දොස් කීම　2) වෛර කිරීම　3) බොරු කීම　4) කලහ කිරීම

63. **යල් පැන ගිය** තීන්දු තීරණ ඇතැම් විට යහපත් ඒවා වන්නට ද පුළුවන.
1) කාලයට නොගැළපෙන　2) යල මහ ඉක්මවා ගිය
3) නවීකරණය වූ　4) කිසිසේත් ක්‍රියාත්මක කළ නොහැකි

64. කෙසේ හෝ **ජාං බේරා ගැනීමට** සමහරු සූරයෝය.
1) චරිතය සුරැකීමට　2) විශාල මුදලක් ලබා ගැනීමට
3) පාඩුවක් නොලබා ගැලවීමට　4) ගත් ණයෙන් නිදහස් වීමට

65. **ජේත්තුවට** රැවටෙන දරුවෝ වර්තමානයේ විරල වෙති.
1) දක්ෂතාවට　2) බාහිර අලංකාරයට　3) රූපයට　4) මුදලට

66. ගුරුතුමා සිය සිසුන් අමතා නිතර පැවසුවේ **උගුරට හොරා බෙහෙත් කෑම** නොකළ යුතු බවයි.
1) බෙහෙත් අවශ්‍යයෙන් ම බීමට ගැනීම
2) කැමැත්තෙන් හෝ ආශාවෙන් එය ඉටු කිරීම.
3) බෙහෙත් නිසා ශරීර සෞඛ්‍යය හොඳ නොවීම
4) අකමැත්තෙන් යමක් කිරීම



LIVEWORKSHEETS

67. පුංචි රාළ **කටින් බතල කොළ සිටවන්නකු** ලෙස ගමෙහි ප්‍රසිද්ධියක් දරයි.
1) ප්‍රසිද්ධ ගොවියෙකු බව
2) කෙරුවාව හොඳ අයකු බව
3) කතාව මිස ක්‍රියාව නැති අයෙකු බව
4) ක්‍රියාව මිස වෙන කිසිවක් නොසොයන්නකු බව

68. අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන් **අහසේ තරු ගනිමින්** සිටීම නොකළ යුතු බව ගුරුතුමිය පැවසුවාය.
1) අසීරු වැඩක යෙදීම
2) තාරකා සංගමයට බැඳීම
3) නොකළ හැකි දේ ගැන සිතීම
4) අනාගතය ගැන නොසිතීම

69. සිලිඳු සිරගත වීමට පෙර සෑම දිනකම **මිටි තැනින් වතුර බසින** බව නිතර මුමුණමින් සිටියේය.
1) වැරදි කරන්නේ නිලධාරීන් බව
2) නිලධාරීන් වැරදි කළත් අසු නොවන බව
3) සියලු වැරදි දුබලයින්ට පැවරෙන බව
4) වතුර බැසීමට පොළව සමතලා විය යුතු බව

70. ඒ නිලධාරියා **හතරවරංකාරයකු** බව කවුරුත් දනිති.
1) කිසිදු වැඩක් නොකරන්නකු
2) වැඩ රැසක් කරන්නෙකු
3) හතර අත ගමන් කරන්නෙකු
4) වංචනික පුද්ගලයකු

71. තම දරුවා **සිකුරට** ම විභාගය සමත් වන බව දෙමාපියෝ දැන සිටියහ.
1) ස්ථිරව
2) කෙසේ හෝ
3) සිකුරු ග්‍රහයා සේ
4) ඉහළින්ම

72. ඔය **අලියන් වෙලාවේ** කැලෑවේ ගමන් කිරීම හොඳ නැති බව කාගේත් මතය විය.
1) අලි එළිබහින වෙලාව
2) අඳුර වැටෙන වෙලාව
3) අලි ගැවසෙන වෙලාව
4) අලි යන එන වෙලාව

73. අපිත් **ඉර හඳ දුටු මිනිස්සු** වෙමු.
1) හිරු හා චන්ද්‍රයා ගැන හොඳින් දන්නා
2) දිවා රෑ වෙහෙස වී වැඩ කරන
3) යමක් කමක් දන්නා
4) ලෝකය ගැන දන්නා

74. මම **දහසකුත් එකක** බලාපොරොත්තු අතර අතරමං විමි.
1) අධික
2) දහසක් පමණ
3) දහසකින් එකක්
4) එක් දහස් එකක්

75. "එවුන්ට දූත් **අං ඇවිල්ලා** ඒකයි අපව පෙනෙන්නේ නැත්තේ"
1) චණ්ඩි වෙලා
2) මෝඩ වෙලා
3) ආඩම්බරයට පත් වෙලා
4) තරහ වෙලා

76. කමිටුවේ ඒකමතික තිරණය සියලු දෙනාම **මුදුනින් පිළිගත්** බව වාර්තා විය.
1) ඉතා ශ්‍රේෂ්ඨ යයි සැලකූ බව
2) වැඩි ඡන්දයෙන් පිළිගත් බව
3) ගෞරව සම්ප්‍රයුක්තව භාරගත් බව
4) සතුටින් අනුමත කළ බව

77. තම පරිසර සංරක්ෂණ වැඩ පිළිවෙළ **අඟින් කිරි දෙවීමක්** නොවන බව විදුහල්පති පැහැදිලි කළේය.
1) නිෂ්ඵල උත්සාහයක්
2) ඉතා වටිනා දෙයක්
3) පැහැදිලි දර්ශනයක්
4) හදිසියේ ක්‍රියාත්මක වූවක්

78. **ආලවට්ටං** නැතුව කියන්න තියෙන දේ කෙලින්ම කියන්න ළමයා යයි නැන්දා කීවාය.
1) ආදරයක් නැතිව
2) අනවශ්‍ය වර්ණනාවලින් තොරව
3) රසවත් කතා සහිතව
4) අතිශයෝක්ති නොමැතිව

79. පොළොන්නරු රාජධානියට **නව එළියක්** ලබාදුන්නේ පැරකුම්බා රජතුමාය.
1) ආලෝක ධාරාවක්
2) අලුත් අර්ථ කථනයක්
3) අලුත් දියුණුවක්
4) නව විධ ආලෝකයක්



LIVEWORKSHEETS

80. පෙර හෙළ රජවරු **ඉර හඳ පවතිනා තෙක්** ස්ථිර කොට විහාරාරාම උදෙසා ගම් බිම් පිදූහ.
1) ලොව පවතිනා තෙක් 2) ඉර හඳ ගැන දැනගන්නා තෙක්
3) ඉර හඳ පායන විට 4) ඉර හඳ තිබෙන විට

81. මා ඔවුන් ගේ **උප්පරවැට්ටිවලට** හසුවන්නේ නැතැයි ආයතන ප්‍රධානියා පැවසුවේය.
1) දැලකට 2) රැවටිල්ලකට 3) සැලැස්මකට 4) දෝෂයකට

82. චිත්‍රපට සම්මාන උළෙලෙහි ප්‍රේක්ෂකාගාරය **අරුමෝසම්** ඇඳුමෙන් සැරසුණු නළු නිළියන්ගෙන් පිරී ගියේය.
1) විසිතුරු 2) ලස්සන 3) දීප්තිමත් 4) මෝස්තර

83. පොල් වගාවට වූ **ආලපාලුව** නිසා වෙළඳ පොළෙහි පොල් මිල අහස උසට නැග ගියේය.
1) පොල් ගස් කපා දැමීය 2) පලදාවට වූ හානිය
3) පොල් වගා නොකිරීම 4) පොල් පලදාව අඩුවීම

84. විභාග ප්‍රතිඵල අසාර්ථක වූ නිසා විපුල ගෙදර පැමිණියේ **දෙගිඩියාවෙනි.**
1) බියෙනි 2) කලකිරීමෙනි 3) දුකෙනි 4) සැකයෙනි

85. බොරු පොරොන්දු දී **ඇඟිල්ලේ නැටවීමට** සමහරු සූරයෝය.
1) සිතැඟි ලෙස හසුරුවා ගැනීමට 2) බලපෑම් කිරීමට
3) තර්ජනය කිරීමට 4) ඉබාගාතේ යැවීමට

86. **පොට වරද්දා ගැනීම** නිසා ප්‍රශ්නය බැරෑරුම් වූ බව ගුරුතුමා පැහැදිලි කළේය.
1) ලණුවේ අග මුල නොදැනීම 2) නිවැරදි උත්සාහය
3) වැරදි පිළිතුරු සැපයීම 4) වැරදි පියවරක් ගැනීම

87. **වැලේ වැල් නැතිව සිටි** තමාට දූන් හොඳ කාලයක් උදාවී ඇති බව එතුමා සිය කතාවේ දී කීවේය.
1) මහත් දුෂ්කරතා සහිතව 2) එල්ලීමට ආධාරකයක් නැතිව
3) ආර්ථික අමාරුකම් ඇතිව 4) විශාල මුදල් කන්දරාවක් නැතිව

88. සමහරු ආගම **දඩමීමා කරගෙන** මුදල් උපයති.
1) දඩ අයකර ගැනීම සඳහා 2) වාසියට යොදාගෙන
3) උපකාර කරගනිමින් 4) විනාශ කරමින්

89. **වැලේ වැල් නැතිව** සිටි ඔහුට දූන් හොඳ කාලයක් උදා වී ඇති බව ඇතැමෙක් පවසති.
1) මහත් දුෂ්කරතා 2) තාඩන පීඩන
3) කර කියා ගත නොහැකිව 4) ආර්ථික අපහසුතා ඇතිව

90. ඔව්හු **තෙලෙන් හා කිරෙන් අත හෝදන** පිරිසක් වූහ.
1) මුදල් නාස්ති කරන 2) හිතුවක්කාර ලෙස වැඩ කරන
3) සුඛෝපභෝගී ජීවිත ගතකරන 4) හොඳ නරක තේරුම් නොගත්

91. සේවකයෝ **ගජරාමෙට** වැඩ කරන නිසා කර්මාන්ත ශාලාවේ ආදායම ඉහළ ගියේය.
1) අවංකව 2) ඉතා කඩිසරව 3) උදාසීන බවෙන් 4) සාමූහිකව

92. පාසලේ සියලු දෙනා සමග සතුටින් සිටින බැවින් **පොතේගුරා** විය නොහැකි බව විදුහල්පතිතුමා පැහැදිලි කළේය.
1) නීතියට ම වැඩ කරන්නා 2) සමාජවාදියා
3) සැර පරුෂ 4) නිදහස්



LIVEWORKSHEETS

93. **වැලි කෙළියේ** පටන් එකට සිටි මිත්‍රයා හදිසියේ වෙන් වීම පිළිබඳව ඔහුට දැඩි කනස්සල්ලක් ඇති විය.
1) වැලි මිශ්‍ර කිරීමෙන් 2) තරුණ අවධියේ 3) තනිවූ කාලයේ 4) බාල අවධියේ

94. **බොර දියේ මාළුන් ඇල්ලීම** නොකළ යුතු බව සාමාජිකයෙක් අධ්‍යක්ෂකතුමාට කීවේය.
1) දුප්පතුන් පමණක් අල්ලා ගැනීම 2) දැඩි කරදරයෙන් නිදහස් වීම
3) අවුල් තත්ත්වයෙන් ඵල නෙළා ගැනීම 4) අඳුරෙන් එළියට ඒම

95. උත්සාහයේ **මල් පල හට ගැනීම** පිළිබඳව ඔව්හු බොහෝ ප්‍රීති වූහ.
1) චාතුර්යය 2) සාර්ථකත්වය 3) මුහුකුරා යාම 4) සමෝධානය

96. පිරිහෙමින් පැවති ආයතනයට **නව එළියක්** ලබා දුන්නේ තරුණ කළමනාකාරතුමාය.
1) අලුත් ආලෝකයක් 2) ආලෝක ධාරාවක්
3) නව අර්ථ කථනයක් 4) අලුත් දියුණුවක්

97. තමාට ඇතිවූ අපහසුතාවට **හැරෙන තැපෑලෙන්** පිළිතුරු දීමට එතුමා අමතක නොකළේය.
1) පණිවුඩ හරවා යැවීමෙන් 2) ඉතා ඉක්මනින්
3) පළිගැනීමෙන් 4) දොස් පැවරීමෙන්

98. **තාරබර හැර** සිදු වූ සිද්ධිය ප්‍රකාශ කරන ලෙස විදුහල්පතිතුමා ශිෂ්‍යයාට කීවේය.
1) වැඩියෙන් කී දේ බැහැර කොට 2) තාරවල තිබෙන බර හැර
3) වටිනාකම ඉතිරි නොකොට 4) ඉතා සරලව

99. සභාපතිතුමා **අත ගහන තුරු** ප්‍රශ්නය නිමා නොවන බව බොහෝ දෙනාගේ අදහස විය.
1) උපදෙස් දෙන 2) ඉවත් කරන 3) පහර දෙන 4) මැදිහත් වන

100. ප්‍රශ්නයට පිළිතුරු දෙමින් එතුමා කළේ **සුදුහුණු ගෑමකි** යි සාමාජිකයෙක් පැවසීය.
1) ආරක්ෂා කිරීමකි 2) පාපොච්චාරණය 3) සත්‍ය වසන් කිරීමකි 4) වාක් සංග්‍රාමයකි

101. **ආතක් පාතක් නැති** අය දේශපාලනයට පැමිණ රට විනාශ කරන බව මුල්ගුරුතුමා සිය කතාවේදී පැහැදිලි කළේය.
1) කිසිදු වැදගත්කමක් නැති 2) මුදල් හිඟ
3) පිටරටවල අය 4) මුදල් ගසාකන

102. රජයේ ආයතනවලට **පස්ස දොරෙන්** සේවකයන් බඳවා ගැනීම පිළිබඳව තරුණ සංගම් සිය විරෝධතාව පෙන්වීය.
1) සුදුසුකම් නැතිව 2) රහසිගතව 3) සංවිධානාත්මකව 4) අයුතු ලෙස



LIVEWORKSHEETS